# ශ්‍රී ලංකා මහ බැංකුව

## දිළිඳුකම පිටුදැකීම සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය

## II වන අදියර යටතේ තනතුරු පුරප්පාඩු

## (කොන්ත්‍රාත් පදනම)

ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වශයෙන් 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වන කාලය තුළදී යාපනය, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම, වවුනියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, පුත්තලම, අනුරාධපුරය, පොලොන්නරුව, බදුල්ල, මොණරාගල හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි දිළිඳුකම පිටුදැකීම සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘතියේ II වන අදියර ක්‍රියාත්මක කරනු ලැබේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ, ආදායම් උත්පාදන කටයුතු සඳහා ණය පහසුකම් සැලසීම, සහභාගිත්ව මූල්‍ය ආයතනයන්හි සහ සහභාගිත්ව නියෝජිත ආයතනයන්හි කළමනාකරණ හා පුහුණුකිරීමේ හැකියාවන් වර්ධනය කිරීම සහ ප්‍රතිලාභීන්ගේ ආදායම් උත්පාදන අවස්ථාවන් ඉහළ නැංවීම හා නිපුණතා සංවර්ධනය කිරීම මගින් අඩු ආදායම්ලාභී ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමත්, ඔවුන් හට විධිමත් මූල්‍ය අංශයට සම්බන්ධ වී ලබා ගත හැකි මූල්‍ය සේවාවන් වර්ධනය කිරීමත්, එමගින් දිළිඳුකම පිටුදැකීම සඳහා ක්‍රියාකාරීව දායකවීම, ප්‍රාදේශීය සංවර්ධනයේ අසමතුලිතතාවය අවම කිරීම හා සාමය ගොඩනැංවීම සඳහා සහය වීමයි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය කොළඹ පිහිටුවනු ලබන අතර පහත සඳහන් දිස්ත්‍රික්කවලින් සමන්විත එක් එක් කලාප තුළ පිහිටි ප්‍රධාන නගර පහක ව්‍යාපෘති ප්‍රාදේශීය කාර්යාල පහක් ස්ථාපිත කිරීමට යෝජිතය.

- **උතුරු ප්‍රදේශය :** (i) යාපනය : (යාපනය, කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කයන් ආවරණය කිරීම සඳහා)
  (ii) වවුනියාව:(වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කයන් ආවරණය කිරීම සඳහා)
- **උතුරු මැද ප්‍රදේශය :** (iii)අනුරාධපුරය : (පුත්තලම, අනුරාධපුරය සහ පොලොන්නරුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන් ආවරණය කිරීම සඳහා)
- **නැගෙනහිර ප්‍රදේශය :** (iv)මඩකලපුව: (ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයන් ආවරණය කිරීම සඳහා)
- **ඌව ප්‍රදේශය :** (v)මොණරාගල : (බදුල්ල, මොණරාගල සහ රත්නපුර දිස්ත්‍රික්කයන් ආවරණය කිරීම සඳහා)

ඉහත ව්‍යාපෘතියේ පහත දැක්වෙන තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. තනතුර :

### ප්‍රාදේශීය ව්‍යාපෘති කළමනාකරු (තනතුරු 5 - එක් ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාලයක තනතුරු 1 බැගින්)

(i) **සුදුසුකම් සහ පළපුරුද්ද :**

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක සා මාජිකත්වය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යා/කළමනාකරණ විෂයයන්ගෙන් පශ්චාත් උපාධි සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ලබා තිබී ම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර 08 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම. බැංකු/මූල්‍ය/සුළු පරිමාණ ණය දෙන ආයතනයකින් ලැබූ පළපුරුද්ද ප්‍රමුඛ වේ.

හෝ

රජයේ දිප ව්‍යාප්ත සේවාවන් වල 1 වන පංතියේ නිලධාරියෙකු වීම හෝ සුළු පරිමාණ ණය/බැංකු/ මූල්‍ය ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්ත්වයක් සහිත නිලධාරියෙකු වීම

සහ

අවම වශයෙන් 1 වන පංතියේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

(ii) **භාෂාමය නිපුණතාවය :**

යාපනය, වවුනියාව හා මඩකලපුව ප්‍රදේශ සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වන අතර අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශ සඳහා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

(iii) **අමතර සුදුසුකම් :**

මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතියක කටයුතු කිරීමේ පළපුරුද්දක් ලබා තිබී ම, සුළු පරිමාණ ණය ලබා දීමේ පළපුරුද්දක් ලබා තිබීම, පරිගණක භාවිතය පිළිබඳ දැනුමක් සහිත වීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාවක් තිබීම.

(iv) **වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ අවරුදු 57 ට නොවැඩි විය යුතුය.

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කෙරේ.

**ප්‍රාදේශීය ණය සම්බන්ධීකාරක හා මෙහෙයුම් සම්බන්ධීකාරක (තනතුරු 5 - එක් ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාලයක තනතුරු 1 බැගින්)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

රජයේ දිප ව්‍යාප්ත සේවාවන්වල II/1 පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරියකු වීම හෝ ඒ හා සමාන තත්ත්වයක් සහිත නිලධාරියකු වීම

සහ

සමාජ සජ්වීකරණය, සුළු පරිමාණ/සංවර්ධන ණය ලබා දීම සහ ව්‍යාපෘති මෙහෙයවීම පිළිබඳ II/1 පංතියේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක සාමාජිකත්වය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යා/කළමනාකරණ විෂයයන්ගෙන් පශ්චාත් උපාධි සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසුව සමාජ සජ්වීකරණය, සුළු පරිමාණ/සංවර්ධන ණය ලබා දීම සහ ව්‍යාපෘති මෙහෙයවීම පිළිබඳව අවම වශයෙන් වසර 5 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

(ii) **භාෂාමය නිපුණතාවය :**

යාපනය, වවුනියාව හා මඩකලපුව ප්‍රදේශ සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වන අතර අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශ සඳහා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘතියක පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම, පරිගණක භාවිතය පිළිබඳ දැනුමක් තිබීම, පරිගණක තාක්ෂණය භාවිතයෙන් ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු පිළිබඳ දැනුමක් තිබීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස :** අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 57 ට නොවැඩි

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කරනු ලැබේ.

**ප්‍රාදේශීය පුහුණු සම්බන්ධීකාරක**

**(තනතුරු 5 - එක් ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාලයක තනතුරු 1 බැගින්)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

රජයේ දිප ව්‍යාප්ත සේවාවන්වල II/1 පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරියකු වීම හෝ ඒ සමාන තත්ත්වයක් සහිත නිලධාරියකු වීම

සහ

සුළු පරිමාණ/සංවර්ධන ණය ව්‍යාපෘතියක සමාජ සජීවීකරණය, ප්‍රතිලාභීන්ගේ හා කාර්ය මණ්ඩලවල පුහුණුව හා ධාරිතා වර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයේ II/1 පංතියේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක සා මාජිකත්වය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යා/කළමනාකරණ විෂයයන්ගෙන් පශ්චාත් උපාධි සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ලබා තිබී ම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසුව සමාජ සජීවිකරණය, ප්‍රතිලාභීන්ගේ හා කාර්ය මණ්ඩලවල පුහුණුව හා ධාරිතා වර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

**(ii) භාෂාමය නිපුණතාවය :**

යාපනය, වවුනියාව හා මඩකලපුව ප්‍රදේශ සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වන අතර අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශ සඳහා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

ප්‍රජා සංවර්ධන හෝ දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතියක පළපුරුද්ද ලබා තිබීම, පරිගණක භාවිතය පිළිබඳ දැනුමක් තිබීම, ප්‍රතිලාභීන් හා කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සඵලදායී ලෙස පැවැත්වීමට හැකියාව තිබීම. පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) පාඨමාලා හදාරා ඇති හෝ පුහුණුකරුවන් ලෙස ක්‍රියා කර ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ. භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස** : අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 57 ට නොවැඩි

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කරනු ලැබේ.

**ප්‍රාදේශීය අලෙවි සම්බන්ධීකාරක**

**(තනතුරු 5 - එක් ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාලයක තනතුරු 1 බැගින්)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

රජයේ දිප ව්‍යාප්ත සේවාවන්වල II/1 පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරියකු වීම හෝ ඒ සමාන තත්ත්වයක් සහිත නිලධාරියකු වීම

සහ

අලෙවිකරණය හා තාක්පන හුවමාරුව පිළිබඳ ක්ෂේත්‍රයේ II/1 පංතියේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

අලෙවිකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් අලෙවිකරණය/කළමනාකරණය විෂයයන්ගෙන් පශ්චාත් උපාධි සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසුව අලෙවිකරණය හා තාක්ෂණ හුවමාරුව පිළිබඳ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

**(ii) භාෂාමය නිපුණතාවය :**

යාපනය, වවුනියාව හා මඩකලපුව ප්‍රදේශ සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වන අතර අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශ සඳහා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

ග්‍රාමීය නිෂ්පාදිත සඳහා වෙළෙඳපොළ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම, පර්යේෂණ පැවැත්වීම (දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම) පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම, පරිගණක භාවිතය පිළිබඳව දැනුමක් තිබීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස** : අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 57 ට නොවැඩි

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කරනු ලැබේ.

**ගණකාධිකාරී (තනතුරු 01 - මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

රජයේ ගණකාධිකරණ සේවයේ හෝ රජයේ විගණන සේවයේ II/I පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරියකු හෝ ගිණුම්කරන හෝ විගණන ක්ෂේත්‍රයේ ඒ සමාන තත්ත්වයක නිලධාරියකු වීම.
සහ
ගිණුම්කරණ/සහ විගණන ක්ෂේත්‍රයේ II/I පංතියේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ (CIMA)/වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA)/ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL)/ගිණුම්කරණය/විගණනය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූල්‍ය හෝ කළමනාකාරිත්ව ගණකාධිකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ලබා තිබීම.
සහ
සුදුසුකම් ලබාගැනීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ ගිණුම්කරණ/සහ විගණන ක්ෂේත්‍රයේ වර්ෂ 05 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(ii) **භාෂා නිපුණතාවය :**

රාජ්‍ය භාෂා (සිංහල/දෙමළ) වලින් එකකින් සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක ගිණුම්කරණය සහ මූල්‍ය කලමනාකරණය පිළිබඳ පළපුරුද්දක් තිබීම, පරිගණක භාවිතය පිළිබඳ දැනුමක් සහිත වීම හා භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස :** අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 57 ට නොවැඩි

(v) **වැටුප :** සාකච්ඡා කර තීරණය කෙරේ.

## තොරතුරු තාක්ෂණ සහ මෙහෙයුම් හා විශ්ලේෂන නිලධාරී (තනතුරු 1 - මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය)

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

රජයේ දිප ව්‍යාප්ත සේවාවන්වල II/I පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරියෙකු වීම හෝ ඒ හා සමාන තත්ත්වයක් සහිත නිලධාරියෙකු වීම.
සහ
විශාල ප්‍රමාණයේ වාණිජමය/සංවර්ධන ව්‍යාපෘතියක දත්ත පද්ධති නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය ආශ්‍රිත පරිගණක දෘඩාංග (Hardware) ආශ්‍රිත ගැටළුවලට පිළියම් යෙදීම, අභ්‍යන්තර වෙබ් අඩවි නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම, වාණිජමය මෘදුකාංග නිර්මාණය කිරීම පිළිබඳව II/I පංතියේ අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් ලබා තිබීම
හෝ
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ක්ෂේත්‍රය යටතේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පශ්චාත් උපාධි සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ලබා තිබීම
සහ

විශාල ප්‍රමාණයේ වාණිජමය/සංවර්ධන ව්‍යාපෘතියක දත්ත පද්ධති නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය ආශ්‍රිත පරිගණක දෘඩාංග (Hardware) ආශ්‍රිත ගැටළුවලට පිළියම් යෙදීම, අභ්‍යන්තර වෙබ් අඩවි නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම වාණිජමය මෘදුකාංග නිර්මාණය කිරීම පිළිබඳව ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් සුදුසුකම් ලැබීමෙන් පසුව ලබා තිබීම.

**(ii) භාෂා නිපුණතාවය :**

රාජ්‍ය භාෂා (සිංහල/දෙමළ) වලින් එකකින් සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක මෙහෙයුම් සහ විශ්ලේෂන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම හා භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස :** අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 57 ට නොවැඩි

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කෙරේ.

**සහකාර තොරතුරු තාක්ෂණ සහ මෙහෙයුම් හා විශ්ලේෂන නිලධාරී (තනතුරු 5 - එක් ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාලයක තනතුරු 1 බැගින්)**

(i) **සුදුසුකම් සහ පළපුරුද්ද :**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ වෙනත් ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම

සහ

වාණිජමය/සංවර්ධන ව්‍යාපෘතියක දත්ත පද්ධති නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය ආශ්‍රිත පරිගණක දෘඩාංග (Hardware) ආශ්‍රිත ගැටළුවලට පිළියම් යෙදීම, අභ්‍යන්තර වෙබ් අඩවි නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම, වාණිජමය මෘදුකාංග නිර් මාණය කිරීම පිළිබඳව විධායක මට්ටමේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් සුදුසුකම් ලැබීමෙන් පසුව ලබා තිබීම.

හෝ

පිළිගත් ආයතනයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 2 ක කාල පරිච්ඡේදයකට නොඅඩු පාඨමාලාවකින් පසු සහතික පත්‍රයක්/ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

වාණිජමය/සංවර්ධන ව්‍යාපෘතියක දත්ත පද්ධති නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය ආශ්‍රිත පරිගණක දෘඩාංග (Hardware) ආශ්‍රිත ගැටළුවලට පිළියම් යෙදීම, අභ්‍යන්තර වෙබ් අඩවි නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම, වාණිජමය මෘදුකාංග නිර් මාණය කිරීම පිළිබඳව කණිෂ්ඨ විධායක මට්ටමේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක් සුදුසුකම් ලැබීමෙන් පසුව ලබා තිබීම.

(ii) **භාෂා නිපුණතාවය :**

යාපනය, වවුනියාව හා මඩකලපුව ප්‍රාදේශ සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වන අතර අනුරාධපුර හා මොණරාගල ප්‍රාදේශ සඳහා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

(iii) **අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක මෙහෙයුම් සහ විශ්ලේෂන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම හා භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස** : අවුරුදු 25 ට නොඅඩු සහ අවරුදු 57 ට නොවැඩි

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කෙරේ.

**කණිෂ්ඨ විධායක නිලධාරී (තනතුරු 06 - මධ්‍යම ව්‍යාපෘති කාර්යාලයේ තනතුරු 01 සහ එක් ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාලයක තනතුරු 1 බැගින්)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් හෝ වෙනත් ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව, සුළු මුදල් රෙජිස්ටරය කළමනාකරණය කිරීම ඇතුළු කාර්යාල පරිපාලනය පිළිබඳව පිළිගත් ආයතනයක කණිෂ්ඨ විධායක මට්ටමේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

පිළිගත් ආයතනයකින්, කළමනාකරණ/පරිපාලන/කාර්යාල කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර 2 ක කාල පරිච්ඡේදයකට නොඅඩු සහතික පත්‍රයක්/ඩිප්ලෝ මාවක් ලබා තිබීම

සහ

සුදුසුකම් ලැබීමෙන් පසුව, සුළු මුදල් රෙජිස්ටරය කළමනාකරණය කිරීම ඇතුළු කාර්යාල පරිපාලනය පිළිබඳව අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක් ලබා තිබීම.

**(ii) භාෂා නිපුණතාවය :**

රාජ්‍ය භාෂා (සිංහල/දෙමළ) වලින් එකකින් සහ සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය සඳහා අනිවාර්ය වේ.

යාපනය, වවුනියාව හා මඩකලපුව ප්‍රදේශ සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වන අතර අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශ සඳහා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක පරිපාලන වැඩ කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම, පරිගණකවලින් වැඩ කිරීමේ දැනුම තිබීම, පොත් තැබීම පිළිබඳ දැනුම තිබීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස :** අවුරුදු 23 ට නොඅඩු සහ අවරුදු 57 ට නොවැඩි

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කෙරේ.

**යතුරු ලේඛක (සිංහල සහ ඉංග්‍රීසි) සහ දත්ත පිවිසුම් ක්‍රියාකරු (තනතුරු 01 - මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

1. (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ
   (ආ) ගණිතය
   ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම.

1. අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයයක් (පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සමත්වී තිබීම.

2. පිළිගත් ආයතනයකින් පවත්වනු ලබන සිංහල සහ/හෝ ඉංග්‍රීසි ලඝු ලේඛන සහ යතුරු ලියන සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

   හෝ

   අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සිංහල සහ/හෝ ඉංග්‍රීසි ලඝු ලේඛනය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4. පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 02 ක ලඝු ලේඛන-යතුරු ලියන පළපුරුද්ද.

5. සිංහල ලඝුලේඛනය සඳහා විනාඩියට වචන 60 ක සහ සිංහල යතුරුලියනය සඳහා විනාඩියට වචන 20 ක වේගයක් ද, ඉංග්‍රීසි ලඝුලේඛනය සඳහා විනාඩියට වචන 80 ක සහ ඉංග්‍රීසි යතුරුලියනය සඳහා විනාඩියට වචන 40 වේගයක් ද තිබිය යුතුය.

**(i) භාෂා නිපුණතාවය :**

සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් වැඩ කිරීමේ දැනුම

**(ii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක හෝ සුළු පරිමාණ ණය සහ ධාරිතා සංවර්ධනය සම්බන්ධ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක පළපුරුද්දක් ලබා තිබීම, දත්ත ඇතුළත් කිරීමේ කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iii) **වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවරුදු 45 ට නොවැඩි

(iv) **වැටුප** : සාකච්ඡා කර තීරණය කෙරේ.

**යතුරු ලේඛක (ඉංග්‍රීසි සහ දෙමළ) සහ දත්ත පිවිසුම් ක්‍රියාකරු (තනතුරු 01 - මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

1. (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ
(ආ) ගණිතය
ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම.

2. අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයයක් (පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සමත්වී තිබීම.

3. පිළිගත් ආයතනයකින් පවත්වනු ලබන දෙමළ සහ/හෝ ඉංග්‍රීසි ලඝු ලේඛන සහ යතුරු ලියන සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

හෝ

අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙමළ සහ/හෝ ඉංග්‍රීසි ලඝු ලේඛනය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4. පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 02 ක ලඝු ලේඛන-යතුරු ලියන පළපුරුද්ද.

5. දෙමළ ලඝුලේඛනය සඳහා විනාඩියට වචන 60 ක සහ දෙමළ යතුරුලියනය සඳහා විනාඩියට වචන 20 ක වේගයක් ද, ඉංග්‍රීසි ලඝුලේඛනය සඳහා විනාඩියට වචන 80 ක සහ ඉංග්‍රීසි යතුරුලියනය සඳහා විනාඩියට වචන 40 වේගයක් ද තිබිය යුතුය.

**(ii) භාෂා නිපුණතාවය :**

දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වැඩ කිරීමේ දැනුම

**(iii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක හෝ සුළු පරිමාණ ණය සහ ධාරිතා සංවර්ධනය සම්බන්ධ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක පළපුරුද්දක් ලබා තිබීම, දත්ත ඇතුළත් කිරීමේ කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි

(v) **වැටුප** : සාකච්ඡා කර තීරණය කෙරේ.

## 1.11 දත්ත පිවිසුම් ක්‍රියාකරු (තනතුරු 06 - මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය හා අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාල සඳහා)

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

1. (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ
   (ආ) ගණිතය
   ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම.
2. අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයයක් (පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සමත්වී තිබීම.
3. පිළිගත් ආයතනයකින් පවත්වනු ලබන මයික්‍රොසොෆ්ට් ඔෆිස් (Microsoft Office) පිළිබඳ සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම
4. පිළිගත් ආයතනයක, දත්ත පිවිසුම් ක්‍රියාකරුවකු ලෙස අවම වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් අවම වශයෙන් එක වසරක් AS 400 ආශ්‍රිත දත්ත පිවිසුම් ක්‍රියාකරවීමේ පළපුරුද්දක් සහිත විය යුතුය.

**(ii) භාෂා නිපුණතාවය :**

ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක දත්ත ඇතුළත් කිරීමේ කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම හෝ සුළු පරිමාණ ණය සහ ධාරිතා සංවර්ධනය සම්බන්ධ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක දත්ත ඇතුළත් කිරීමේ කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි

(v) **වැටුප :** සාකච්ඡා කර තීරණය කෙරේ.

1.12 **රියැදුරු : (මධ්‍යම ව්‍යාපෘති කාර්යාලයේ තනතුරු 01 සහ එක් ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාලවල තනතුරු 01 බැගින්)**

**(i) සුදුසුකම් සහ පළපුරුද්ද :**

1. (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ

(ආ) ගණිතය

ඇතුළුව විෂයයන් හයකින් එක් වරකදී අ.පො.ස. (සා.පෙ.) විභාගය ස මත්ව තිබීම.

2. බර වාහන ධාවනය සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් හිමිව තිබීම සහ පිළිගත් ආයතනයක බර වාහන පැදවීම පිළිබඳව අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් ලබා තිබීම.

**(ii) භාෂා නිපුණතාවය :**

යාපනය, වවුනියාව හා මඩකලපුව ප්‍රදේශ සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වන අතර අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශ සඳහා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම අනිවාර්ය වේ.

**(iii) අමතර සුදුසුකම් :**

විශාල පරිමාණයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක හෝ සුළු පරිමාණ ණය සහ ධාරිතා සංවර්ධනය සම්බන්ධ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක වාහන පැදවීමේ පළපුරුද්ද ලබා තිබීම, දීර්ඝ කාලයක් ක්ෂේත්‍රය තුළ සේවයේ නිරත වීමට හැකියාව තිබීම, සාමාන්‍ය වාහන නඩත්තු කටයුතු පිළිබඳව දැනුමක් තිබීම සහ භාෂා තුනෙන්ම වැඩ කිරීමේ හැකියාව තිබීම.

(iv) **වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවරුදු 45 ට නොවැඩි

(v) **වැටුප :** සාකච්ඡා කර තීරණය කෙරේ

2. **සේවා කොන්දේසි සහ නියමයන් :**

(i) දිළිඳුකම පිටුදැකීම සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය - II වන අදියර යටතේ කොන්ත්‍රාත් පදනම මත මූලික වශයෙන් එක් අවුරුදු කාලසීමාවකට අදාල තනතුරෙහි පිහිටුවනු ලැබේ. ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සේවා කාර්යක්ෂමතාවය මත සලකා බලනු ලැබේ.

(ii) රාජකාරි කටයුතු ඉටු කිරීමේදී අවශ්‍යතාවය මත ව්‍යාපෘති දිස්ත්‍රික්කයන්හි ග මන් කිරීමට කැමති විය යුතුය.

(iii) මෙමගින් සිදුකෙරෙන සේවා නියුක්තිය ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා නියුක්තියක් වශයෙන් නොසැලකෙන අතර ඉහත තනතුරු සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ට ඔවුන්ගේ සේවා ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ සේවා නියුක්තිය සඳහා හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමේ කිසිදු අයිතියක් ද නොමැත්තේය.

(iv) රාජ්‍ය සේවයේ, පලාත් පාලන ආයතන ඇතුලුව පලාත් රාජ්‍ය සේවයෙහි, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවයේ නියුතු නිලධාරීන් අයදුම් කරන්නේ නම් ඔවුන්ගේ වැටුප් රහිත නිවාඩු 2007 අප්‍රේල් මස 05 දිනැති මහා භාණ්ඩාගාරයේ අංක 33 දරන කළමනාකරන සේවා චක්‍රලේඛය අනුව අනුමත කර ගත යුතු වේ.

(v) වැටුප කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 33ට අනුව සාකච්ඡා කර තීරණය කරනු ලැබේ.

3. **අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙල :**

(i) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010 අගෝස්තු මස 27 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වන අතර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.

(ii) ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් ඔවුන්ගේ අයදුම්පතෙහි පිටපතක් අයදුම්පත් භාරගන්නා

අවසන් දිනට ප්‍රථම අප වෙත යොමු කළ යුතු අතර මුල් පිටපත අදාල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු වේ.

(iii) නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ඉහත සඳහන් අවසාන දිනට පසුව ලැබෙන හෝ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියමිත සුදුසුකම් සම්පූර්ණ නොකරනු ලැබූ අයදුම්කරුවන් අදාල තනතුරුවලට අයදුම් කිරීමට නුසුදුසු වේ.

(iv) ඉහත තනතුරු සඳහා බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල්දැමීම, බඳවා ගැනීම අවලංගු කිරීම පිළිබඳ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

(v) නියමිත තනතුරු සඳහා වන ආදර්ශ අයදුම් පත්‍ර පහත දක්වා ඇත.

අධ්‍යක්ෂ
මානව සම්පත් දෙපාර්තමේන්තුව